# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2244/22 - 2021 සැප්තැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2021.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 11/3/3/1/32D.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2008/MV/407A.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ, E 389 රඹුක්ඔළුව වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2021.07.09 දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13 හි, අතිරේක අංක 155 හි, පත්‍ර අංක 322 දරන සැලැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.6006 ක් වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබලි අංකය 11039**
ඉඩමේ නම: රඹුක්ඔළුව; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; වගාකරු: ලග්ගල පල්ලේගම, රඹුක්ඔළුව පදිංචි ජයමුද්දර ගෙදර කොමලා විසින් අංක එල්. එල්. 94 දරන බලපත්‍රය මත වගාකර ඇත; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.4047.

02. **කැබලි අංකය 11040**
ඉඩමේ නම: රඹුක්ඔළුව; විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන අය: රජය; අනවසර වගාකරු: ලග්ගල පල්ලේගම, රඹුක්ඔළුව පදිංචි ජයමුද්දර ගෙදර කොමලා; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.1959.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021.09.30 වැනි දින පෙ.ව. 9.00 ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021.09.23 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල කොට්ඨාසය.

2021 අගෝස්තු මස 23 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 122



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

## ශුද්ධි පත්‍රිකාව

*යොමු අංකය* : 3/2/3/10/265-565.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2011/22 හා 2017.03.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 2ඒ සහ 3ඒ පිටුවල සඳහන් කැඩැස්තර සිතියම් අංක 510609 හි කලාප අංක 09 හි පත්‍ර අංක 3 හි කැබලි අංක 469 ලෙස සටහන් වන ඉඩම් කොටස මැනුම් සංශෝධන පරිදි කැඩැස්තර සිතියම් අංක 510609 හි කලාප අංක 09 හි පත්‍ර අංක 6 හි කැබලි අංක 558 හා 559 ලෙස ද, කැබලි අංක 471 කොටස කැබලි අංක 560 හා 561 ලෙස ද, කැබලි අංක 476 කොටස කැබලි අංක 562 හා 563 ලෙස ද විභජනය වී ඇති අතර, එම කැබලිවලට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 558**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. පාලිත පියසිරි, අංක 709/5, වියලගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0384. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා)

02. **කැබලි අංක 559**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. පාලිත පියසිරි, අංක 709/5, වියලගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0186. (අවසතු කිරීම සඳහා)

03. **කැබලි අංක 560**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. එච්. සේනාරත්න, අංක 709/1, වියලගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0450. (අවසතු කිරීම සඳහා)

04. **කැබලි අංක 561**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. එච්. සේනාරත්න, අංක 709/1, වියලගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0756. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා)

05. **කැබලි අංක 562**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. පද්මා සදසීලි, අංක 41, බදුල්ලගහලන්ද, නැ/ දඩගමුව, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0086. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා)

06. **කැබලි අංක 563**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. පද්මා සදසීලි, අංක 41, බදුල්ලගහලන්ද, නැ/ දඩගමුව, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0272. (අවසතු කිරීම සඳහා)

එස්. පී. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 123

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

## ශුද්ධි පත්‍රිකාව

*යොමු අංකය* : 3/2/3/10/265-565.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2011/22 හා 2017.03.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 2ඒ සහ 3ඒ පිටුවල සඳහන් කැඩැස්තර සිතියම් අංක 510609 හි කලාප අංක 09 හි පත්‍ර අංක 3 හි කැබලි අංක 464 සහ 473 ලෙස සටහන් වන ඉඩම් කොටස මැනුම් සංශෝධන පරිදි එම කැබලිවලට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 464**
ඉඩමේ නම: – ; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අත්තනගල්ල ප්‍රාදේශීය සභාව; ප්‍රමාණය: හෙක්. 0.0017. (අවසතු කිරීම සඳහා)

02. **කැබලි අංක 473**
ඉඩමේ නම: බෝගහඕවිට; ඉඩමේ විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. පී. මාලනී හේමලතා, අංක 709/1ඒ, වියලගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0072. (අවසතු කිරීම සඳහා)

එස්. පී. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 123/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.